# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1938/5 – 2015 ඔක්තෝබර් 28 වැනි බදාදා – 2015.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහපත්තුව සුළු කොට්ඨාසයේ, හඳපාන්ගොඩ ගමේ පිහිටි කළුතර කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් 2007.05.28 දිනැතිව සකස් කර ඇති අංක KA/ING/07/142 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.3950 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අංක 01 – මහවත්ත හෙවත් කොටගලහේන – ප්‍රමාණය: හෙක්. 0.3950ක් පමණ

උතුරට: මාර්ග (ප්‍රා. ස.); නැගෙනහිරට: ඉඩමේ නම සොයාගත නොහැකි හඳපාන්ගොඩ මහා විද්‍යාලය; දකුණට: කේ. එම්. එස්. බණ්ඩාර කුලතුංග සහ තවත් අය හිමිකම් කියන මහවත්ත හෙවත් කොටගලහේන; බටහිරට: ප්‍රවේශ මාර්ගය.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: LD/05/2006/E/529.
2015 මැයි මස 28 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 236